# ගා/ රිච්මන්ඩ් විද්‍යාලය
## අවසාන වාර පරීක්ෂණය - 2018

**ගිණුම්කරණය - I / 33 S I**

13 ශ්‍රේණිය | අවසාන වාර පරීක්ෂණය - 2018 | කාලය පැය 2

**උපදෙස් :**

- ප්‍රශ්න අංක 01 සිට 31 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.
- අංක 32 සිට 50 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.

---

**ප්‍රශ්න අංක 01**

පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරනයේ ප්‍රධාන අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයිද ?

(1) ආයතනයක ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීම
(2) ආයතනයක ගනුදෙනු මූල්‍ය වාර්තා පිලියෙල කිරීම සඳහා සටහන් කිරීම
(3) ආයතනයක මූල්‍ය වාර්තා ගිණුම්කරණ ප්‍රමිත පදනම් ව පිළියෙල කිරීම
(4) ආයතනය පිළිබඳ තොරතුරු කළමනාකරුවන්ගේ භාවිතය සඳහා සන්නිවේදනය කිරීම.
(5) ආයතනයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම.

**ප්‍රශ්න අංක 02**

වත්කම් , ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වර්ගීකරණය කිරීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය පදනම් වන්නේ ද ?

(1) උපචිත
(2) අඛණ්ඩ පැවැත්ම
(3) ඓතිහාසික පිරිවැය
(4) කාලච්ඡේද
(5) ආරක්ෂණ

**ප්‍රශ්න අංක 03**

වසර අග තොගය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන මේ දෙකෙන් අඩු අගය මත හඳුනා ගැනීම සඳහා පදනම් වන්නේ කුමන ගිණුම්කරණ සංකල්පය ද ?

(1) උපචිත
(2) කාලච්ඡේද
(3) යථාරූපී
(4) උපලබ්ධි
(5) ආරක්ෂණ

**ප්‍රශ්න අංක 04**

ශ්‍රී ලංකාවේ අනුගමනය කරන මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තොරතුරුවල වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ගති ලක්ෂණයක් නොවන්නේ පහද දෑ අතුරින් කුමක් ද ?

(1) සංසන්දනාත්මක බව
(2) විශ්වසනීය නියෝජනය
(3) සත්‍යාපනය කළ හැකි බව
(4) කාලීන බව
(5) අවබෝධ කර ගත හැකි බව

ප්‍රශ්න අංක 05

පහත කුමන ප්‍රකාශය ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේද ?

(1) සුළු මුදල් ගෙවීම් ජර්නලය ආයතනයක ලෙජර් ගිණුමක් ලෙස ද භාවිතා කෙරේ.

(2) සියලුම මූලික ලියවිලි ආයතනයක ගණකාධිකාරීවරයා විසින් පිළියෙල කරනු ලබයි.

(3) ණය පදනම මත මිල දී ගත් සියලු වත්කම් සටහන් කිරීම සඳහා ගැනුම් ජර්නලය භාවිතා කරනු ලබයි.

(4) ආයතනයක ශේෂ පිරික්සුම තුලනය වීම එහි ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදිතාව තහවුරු කරයි.

(5) භාණ්ඩ ණයට විකුණුම හා බැදි සාරාංශ ගත තොරතුරු ණය ගැති පාලන ගිණුමේ සටහන් කරයි.

ප්‍රශ්න අංක 06

පහත සඳහන් තොරතුරු සීමිත ගංගා පොදු සමාගමට අදාළ වේ.

| | 2018.03.31 දිනට (රු.) | 2017.03.31 දිනට (රු.) |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | - | 75 000 |
| ගෙවිය යුතු අලුත්වැඩියා වියදම් | 60 000 | 90 000 |

- 2016.04.01 දින සමාගම රු. 40 000 ක මාසික කුලියට ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී.
- 2018.03.01 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවූ කුලී සහ අලුත්වැඩියා වියදම් පිළිවෙලින් රු. 580 000 ක් සහ රු. 430 000 ක් විය.

2018.03.31 දිනට කලින් ගෙවූ කුලී සහ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අලුත්වැඩියා වියදම්,

| | කලින් ගෙවූ කුලී (රු. | අලුත්වැඩියා වියදම් (රු.) |
|---|---|---|
| (1) | 25 000 | 400 000 |
| (2) | 35 000 | 420 000 |
| (3) | 45 000 | 400 000 |
| (4) | 25 000 | 420 000 |
| (5) | 15 000 | 540 000 |

ප්‍රශ්න අංක 07

2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආයතනයක් විසින් රු. 720 000 ශුද්ධ වැටුපක් ගෙවන ලදී. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක සහ සේව්‍යාගේ දායකත්වයන් පිළිවෙලින් 10% ක් සහ 15% ක් වන අතර, ඒවා මාර්තු මාසය සඳහා මෙතෙක් ගෙවා නොමැත. සේවකයන්ගේ වැටුපෙන් කරන එකම අඩු කිරීම සේවක අර්ථසාධක අරමුදල් දායකය වේ. මෙම ගනුදෙනුවල බලපෑම ගිණුම්කරණ සමීකරණයෙන් දක්වනුයේ,

| | වත්කම් | - වගකීම් | + හිමිකම් |
|---|---|---|---|
| (1) | රු. 720 000 කින් අඩු වේ. | - රු. 120 000 කින් වැඩිවේ. | රු. 840 000 කින් අඩු වේ |
| (2) | රු. 720 000කින් අඩුවේ. | - රු. 80 000කින් වැඩි වේ. | රු. 800 000 කින් අඩු වේ |
| (3) | රු. 720 000 කින් අඩු වේ | - රු. 200 000 කින් වැඩි වේ. | රු. 920 000 කින් අඩු වේ |
| (4) | රු. 800 000 කින් අඩු වේ. | - රු. 120 000 කින් වැඩි වේ. | රු. 920 000 කින් අඩු වේ |
| (5) | රු. 800 000 කින් අඩු වේ. | - වෙනස් නොවේ | රු. 800 000 කින් අඩු වේ |

ප්‍රශ්න අංක 08

2018.03.31 දිනට සීමිත සුරංග පොදු සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර, එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේදී පහත දෑ හෙළිදරව් විය.

A) වැටුප් හා වේතන සඳහා ගෙවූ රු. 250 000ක මුදල මුදල් පාලන ගිණුමේ පමණක් සටහන් කර තිබුණි.

B) විකුණුම් ජර්නලය රු. 120 000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.

C) ණයගැතියෙකුගෙන් ලද රු. 180 000 ක් මුදල් ගෙවීමක් ලෙස සළකා ණයහිමි පාලන ගිණුමේ සටහන් කර තිබුණි.

D) රු. 60 000 ක ගැනුම් ඉන්වොයිසියක් ණයහිමි ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.

ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමේ ශේෂයක් ඇති වීමට දායක වූයේ ද ?

(1) A හා C පමණි
(2) B හා D පමණි
(3) A , B හා C පමණි
(4) B , C , D පමණි
(5) A , B , C හා D යන සියල්ලම.

ප්‍රශ්න අංක 09

ආයතනයක් විසින් ලකුණු කළ මිල රු. 800 000 ක් වූ භාණ්ඩ 05%ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගෙන පසුව රු. 880 000 කට අත්පිට මුදලට විකුණන ලදී. ණය හිමියන්ට ගෙවිය යුතු මුදල මේ දක්වා පියවා නොමැත. මෙම ගනුදෙනුවල ශුද්ධ බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිරූපණය කරනුයේ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| (1) | රු. 80 000 කින් වැඩිවේ. | වෙනස් නොවේ | රු. 80 000 කින් වැඩි වේ |
| (2) | රු. 120 000 කින් වැඩි වේ. | වෙනස් නොවේ | රු.120 000 කින් වැඩි වේ |
| (3) | රු. 120 000 කින් වැඩි වේ. | රු. 760 000 කින් අඩු වේ. | රු. 880 000 කින් වැඩි වේ |
| (4) | රු. 880 000 කින් වැඩි වේ. | රු. 760 000 කින් වැඩි වේ. | රු. 120 000 කින් වැඩි වේ |
| (5) | රු. 880 000 කින් වැඩඩිවේ. | රු. 800 000 කින් වැඩි වේ. | රු. 80 000 කින් වැඩි වේ. |

ප්‍රශ්න අංක 10

සිමිත ජයන්ත පොදු සමාගමේ 2018.03.31 දිනට ණයහිමි පාලන ගිණුම් ශේෂය රු. 540 000 ක් විය. එම දිනට ණයහිමි ලෙජරයට අනුව ණයහිමියන්ගේ ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 573 000 ක් විය. පසුව කරන ලද විමර්ශනයේදී පහත දෑ හෙළිදරව් විය.

- සැපයුම්කරුවෙකු විසින් නියමිත දිනට නොපිය වූ ශේෂයක් මත අය කරන ලද රු. 15 000 ක පොලිය ණය හිමි ලෙජරයේ පමණක් සටහන් කර තිබුණි.
- ගැනුම් ජර්නලයේ එකතු වූ රු. 75 000 ණය හිමි පාලන ගිණුමේ රු. 57 000 ක් ලෙස සටහන් කර තිබුණි.
- ණය හිමියෙකුට ගෙවූ රු. 32 000 ණය හිමි පාලන ගිණුමේ මෙන්ම ණයහිමි ලෙජරයේ ද සටහන් කර නොතිබුණි.

2018.03.31 දිනට ණය හිමි පාලන ගිණුමේ නිවැරදි ශේෂය,

(1) රු. 526 000
(2) රු. 523 000
(3) රු. 555 000
(4) රු. 508 000
(5) රු. 541 000

ප්‍රශ්න අංක 11

2018.03.31 දිනට සීමිත සුරංග පොදු සමාගමේ ණය ගැති පාලන ගිණුමේ ශේෂය රු. 685 000 ක් වූ අතර, එම දිනට ණයගැති ලෙජරයේ ණයහිමියන්ගේ ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 667 000 ක් විය. පසුව කරන ලද විමර්ශනයේදී පහත සඳහන් දෑ හෙළිදරව් විය.

- රු. 18 000 ක ණය ගැති ශේෂයක් බොල් ණයක් සේ සළකා කපා හැරීම , ණය ගැති පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
- රු. 65 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 56 000 ක් ලෙස විකුණුම් ජර්නලයේ සටහන් වී තිබුණි.
- ණයගැතියෙකු විසින් සෘජුවම බැංකුවට ප්‍රේෂණය කරන ලද රු. 45 000 ක් ණයගැති ලෙජරයේ සහ ණයගැති පාලන ගිණුමේ සටහන් වී නොතිබුණි.

2018.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ නිවැරදි ශේෂය,

(1) රු. 667 000
(2) රු. 676 000
(3) රු. 631 000
(4) රු. 649 000
(5) රු. 585 000

ප්‍රශ්න අංක 12

පහත සඳහන් තොරතුරු 2018 මාර්තු මාසයේ සමාගමක භාණ්ඩයකට අදාල වේ.

| දිනය | විස්තරය | ඒකක ගණන | ඒකකයක පිරිවැය (රු.) |
|---|---|---|---|
| 2018.03.01 | තොගය | 6 000 | 80 |
| 2018.03.12 | ගැනුම් | 8 000 | 90 |
| 2018.03.16 | ආපසු යැවුම් (03.12 ගත් භාණ්ඩ) | 1 000 | ? |
| 2018.03.20 | ගැනුම් | 4 000 | 70 |
| 2018.03.24 | විකුණුම් | ? | ? |
| 2018.03.31 | තොගය | 5 000 | ? |

තොග නිකුත් කිරීම මිල කිරීම සඳහා සමාගම පෙර පිවිසි පෙර පිට ක්‍රමය (FIFO) භාවිතා කරයි. 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය සහ 2018.03.31 දිනට තොගයේ වටිනාකම,

| | විකුණුම් පිරිවැය (රු.000) | තොගය (රු.000) |
|---|---|---|
| (1) | 1 000 | 470 |
| (2) | 1 020 | 370 |
| (3) | 980 | 280 |
| (4) | 1 020 | 280 |
| (5) | 1 000 | 370 |

ප්‍රශ්න අංක 13

මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත කුමන දෑ වත්කමක ලක්ෂණ වන්නේ ද ?

A) එය ආයතනයක් විසින් පාලනය කළ හැකි සම්පතකි

B) එය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරයි.

C) එහි පිරිවැය හෝ අගය විශ්වසනීය ලෙස මැනිය හැකි වේ.

(1) B පමණි (2) A හා B පමණි

(3) A හා C පමණි (4) B හා C පමණි

(5) A B හා C යන සියල්ලම

ප්‍රශ්න අංක 14

විවාහ මංගල උත්සව සඳහා ශාලාවක් කුලියට දීමේ නියුතු ව්‍යාපාර ආයතනයක 2018 අප්‍රේල් මාසය තුළ දී පහත ගනුදෙනු සිදු විය. මෙම ශාලාව රු. 400 000 කට කුලියට දෙනු ලබන අතර, ඉන් 25% ක් ශාලාව වෙන් කරන අවස්ථාවේ දී ද, ඉතිරිය විවාහ මංගල උත්සවයෙන් පසුව සතියක් ඇතුළත් ද ගෙවිය යුතු වේ.

| දිනය | ගනුදෙනුව | වටිනාකම (රු.) |
|---|---|---|
| 2018.04.02 | 2018.03.28 දින පැවති විවාහ උත්සවය සඳහා ලද ඉතිරි මුදල | 300 000 |
| 2018.04.05 | 2018.04.27 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම | 100 000 |
| 2018.04.15 | 2018.05.10 දින පැවැත්වීමට නියමිත විවාහ උත්සවය සඳහා ලද අත්තිකාරම | 100 000 |
| 2018.04.30 | 2018 අප්‍රේල් මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් | 330 000 |

2018 අප්‍රේල් මාසය සඳහා ආදායම හා ලාභය / (අලාභය) සහ 2018.04.30 දිනට ලැබිය යුතු දෑ කොපමණ ද ?

| | ආදායම | ලාභය / අලාභය (රු.) | ලැබිය යුතු දෑ |
|---|---|---|---|
| (1) | 200 000 | (130 000) | 600 000 |
| (2) | 400 000 | 70 000 | 300 000 |
| (3) | 500 000 | 170 000 | 600 000 |
| (4) | 700 000 | 370 000 | 300 000 |
| (5) | 800 000 | 470 000 | 600 000 |

ප්‍රශ්න අංක 15 සහ 16ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පාසලක ආදි ශිෂ්‍ය සංගමයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | වටිනාකම (රු.'000) |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් (මෙයින් 1/4 ක්, 2017.3.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ වේ. | 360 |
| ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ලද පරිත්‍යාග | 500 |
| ස්ථාවර තැන්පතුව මත උපයන ලද පොලී ආදායම | 50 |
| මුළු වියදම් | 300 |

අතිරේක තොරතුරු -

- සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 4 000 කි. 2018.03.31 දිනට සංගමයේ සාමාජිකයන් 100 ක් විය.
- පරිත්‍යාග, ලද වර්ෂයෙන් ආරම්භ වී වර්ෂ 5ක කාලයක් තුළ දී , ආදායම ලෙස හඳුනා ගැනීම සංගමයේ ප්‍රතිපත්තිය වේ.
- ස්ථාවර තැන්පතුව මත පොලී 2018.05.31 දින එය කල්පිරීමේ දී ලැබෙනු ඇත.
- සියලු වියදම් මුදලින් ගෙවා ඇත.
- 2017.03.31 දිනට මුදල් ශේෂය රු. 150 000 කි.

ප්‍රශ්න අංක 15

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය කොපමණ ද ?

(1) රු. 120 000
(2) රු. 210 000
(3) රු. 250 000
(4) රු. 520 000
(5) රු. 650 000

ප්‍රශ්න අංක 16

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ශේෂයේ ශුද්ධ වැඩිවීම කොපමණ ද ?

(1) රු. 470 000
(2) රු. 520 000
(3) රු. 560 000
(4) රු. 610 000
(5) රු. 860 000

ප්‍රශ්න අංක 17

හවුල් ව්‍යාපාරයකට අදාළව පහත කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

(1) හවුල් ව්‍යාපාරයක හිමිකම නිරූපණය කරනු ලබන්නේ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සහ ජංගම ගිණුම් ශේෂයන් සහ වෙනත් සංචිත ඇත්නම් ඒවායේ ද එකතුවෙනි.
(2) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවෙකු වේතනයකට හිමිකම් ලබනුයේ හවුල් ව්‍යාපාරයට යම් සේවාවක් සැපයූ විට පමණි.
(3) 1890 හවුල් ව්‍යාපාර ආඥාපනතෙහි 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් අතර ලාභාලාභ බෙදාහරිනු ලබන්නේ ඔවුන් හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනයට දායක වී ඇති අනුපාතයට ය.
(4) හවුල් ව්‍යාපාරයක කීර්ති නාමය ඇස්තමේන්තු කරනු ලබන්නේ හවුල්කරුවෙකු ඇතුළත් වූ විට දී හෝ විශ්‍රාම ගිය විට දී පමණි.
(5) හවුල්කරුවෙකු ඇතුළත් කරගත හැකි වන්නේ විශ්‍රාම යා හැකි වන්නේ මූල්‍ය වර්ෂයක පළමුවන හෝ අවසාන දිනයේ දී පමණි.

ප්‍රශ්න අංක 18

LKAS 2 (තොග) ප්‍රමිතියේ නිර්වචනයට අනුව තොග ලෙස හඳුනාගත හැකිවන්නේ පහත දැ අතුරින් කුමක් ද?

A - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණීම සඳහා පවත්වා ගනු ලබන භාණ්ඩ
B - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී විකිණීම සඳහා නිෂ්පාදනය වෙමින් පවතින අයිතම
C - නිෂ්පාදන ක්‍රියාවලියේ දී හෝ සේවා සැපයීමේ දී භාවිත කිරීමට ඇති ද්‍රව්‍ය සහ සැපයුම්

(1) A පමණි (2) A හා B පමණි

(3) A හා C පමණි (4) B හා C පමණි

(5) A, B හා C යන සියල්ලම

ප්‍රශ්න අංක 19

පහත තොරතුරු සීමිත ලාල් පොදු සමාගමේ මෝටර් රථ හා බැඳේ.

| විස්තරය | රු. '000 |
|---|---|
| 2017.04.01 දිනට ධාරණ වටිනාකම | 6 500 |
| 2017.09.30 දින විකුණු මෝටර් රථය මත ඇති වූ අලාභය | 150 |
| 2018.01.01 දින නව මෝටර් රථයක් අත්පත් කර ගැනීම | 4 000 |

වර්ෂය අවසානයේ දී පැවති සියලු මෝටර් රථ 2012.04.01 දින මිලදී ගෙන ඇත. වර්ෂය තුළ දී විකුණු මෝටර් රථය රු. 3 000 000 ක පිරිවැයකට මිල දී ගෙන ඇත. මෝටර් රථ වාර්ෂික ව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෝටර් රථ ක්ෂය සහ විකුණන ලද මෝටර් රථයේ විකුණුම් වටිනාකම වනුයේ,

| | ක්ෂය (රු.'000) | විකුණුම් වටිනාකම (රු. '000) |
|---|---|---|
| (1) | 650 | 1 500 |
| (2) | 1 000 | 1 350 |
| (3) | 1 100 | 1 350 |
| (4) | 1 100 | 1 200 |
| (5) | 1 250 | 1 200 |

ප්‍රශ්න අංක 20

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමුදු පොදු සමාගමේ සාරාංශගත ආදායම් ප්‍රකාශනය පහත පරිදි වේ.

| විස්තරය | රු. '000 |
|---|---|
| දළ ලාභය | 280 |
| වියදම් (රු. 20 000 ක ක්ෂය සහ රු. 10 000 කාර්යාලීය උපකරණ විකුණුම් මත අලාභය ද ඇතුළුව | 100 |
| ආදායම් බදු වියදම | 80 |
| වර්ෂය සඳහා ලාභය | 100 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී පහත අයිතමයන්ගේ ශේෂයන් පහත පරිදි වැඩි වී ඇත.

| විස්තරය | රු. '000 |
|---|---|
| තොගය | 80 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 120 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 130 |

වරශය තුළ දී ගෙවූ ආදායම් බදු රු. 50 000 කි.

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතියට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී මෙහෙයුම් කටයුතු තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද ?

(1) රු. 10 000 (2) රු. 90 000

(3) රු. 150 000 (4) රු. 180 000

(5) රු. 230 000

ප්‍රශ්න අංක 21

සීමිත මධුර පොදු සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන , අධ්‍යක්ෂකවරු විසින් 2018.06.15 දින අනුමත කරන ලදී. 2018.03.31 දින සිට 2018.06.15 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමේ සිදු විය.

A - 2018.04.15 දින සිට ව්‍යාපාරයේ කොටසක් වසා දැමීමේ සැලැස්මක් නිවේදනය කරන ලද අතර,

මෙමගින් වාර්ෂිකව රු. 600 000 ක් ඉතිරි කිරීමට අපේක්ෂා කෙරේ.

B - රු. 1 000 000 ක අලාභයක් ජනනය කරමින් 2018.04.20 දින ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නකින් විනාශ විය.

C - 2018.04.30 දින සිදු කළ ණයට විකුණුම් නිසා ඇති වූ රු. 750 000 ක් ශේෂයක් සහිත ණයගැතියෙකු 2018.05.30 දින බුන්වත් විය.

D - 2018.06.15 දින සාමාන්‍ය කොටස් හිමියන්ට රු. 300 000 ක අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

LKAS 10 (වාර්තා කරන කාලච්ඡේදයට පසු සිදු වීම්) ප්‍රමිතියට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත කුමන සිදුවීම් නොගැලපන සිද්ධීන් ලෙස සලකනු ලබයි ද ?

(1) A හා B පමණි
(2) B හා C පමණි
(3) A, C හා D පමණි
(4) B, C හා D පමණි
(5) A, B C හා D යන සියල්ලම

**ප්‍රශ්න අංක22, 23 සහ 24 පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත අරලිය පොදු සමාගමට අදාළ වේ.

| විස්තරය | රු. '000 |
|---|---|
| විකුණුම් | 1 200 |
| විකුණුම් පිරිවැය | 600 |
| මෙහෙයුම් වියදම් | 300 |
| මෝටර් රථයක් විකිණීම මත ලාභය | 80 |
| සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශ | 100 |
| ප්‍රත්‍යාගණනය හිගය - කාර්යාලීය උපකරණ | 120 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - ගොඩනැගිලි | 180 |

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාලීය උපකරණ ප්‍රත්‍යාගණනය මත රු. 90 000 ක අතිරික්තයක් හඳුනාගෙන තිබුණි. 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ප්‍රථම වතාවට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ඇත.

**ප්‍රශ්න අංක 22**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද මුළු ආදායම සහ මුළු වියදම කොපමණ ද ?

| | මුළු ආදායම | මුළු වියදම |
|---|---|---|
| (1) | 1 280 | 900 |
| (2) | 1 340 | 900 |
| (3) | 1 380 | 1 020 |
| (4) | 1 460 | 1 020 |
| (5) | 1 460 | 1 120 |

**ප්‍රශ්න අංක 23**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතියට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගන්නා ලද ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම කොපමණද ?

| | ලාභය | වෙනත් විස්තීර්ණ ආදායම (රු. '000) |
|---|---|---|
| (1) | 160 | 180 |
| (2) | 250 | 90 |
| (3) | 260 | 180 |
| (4) | 350 | 90 |
| (5) | 380 | 60 |

ප්‍රශ්න අංක 24

බණී 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ) ප්‍රමිතියට අනුව 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම සහ රඳවාගත් ඉපැයුම් කොපමණ ද ?

| | මුළු විස්තීර්ණ ආදායම (රු. '000) | රඳවාගත් ඉපැයුම් (රු. '000) |
|---|---|---|
| (1) | 340 | 160 |
| (2) | 340 | 250 |
| (3) | 440 | 250 |
| (4) | 440 | 260 |
| (5) | 440 | 280 |

ප්‍රශ්න අංක 25 සහ 26 පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සමාගමක් භාණ්ඩ නිෂ්පාදනය සඳහා "A" අමුද්‍රව්‍ය යොදා ගනී. මෙම අමුද්‍රව්‍යයේ ඇණවුම් පිරිවැය රු. 250 ක් වන අතර, එහි වාර්ෂික රඳවා ගැනීමේ පිරිවැය ඒකකයකට රු. 100 කි. "A" අමුද්‍රව්‍යයෙහි යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සමාගම ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු "A" අමුද්‍රව්‍යට අදාළ වේ.

| | | |
|---|---|---|
| උපරිම පරිභෝජනය | සතියකට ඒකක | 750 |
| අවම පරිභෝජනය | සතියකට ඒකක | 250 |
| ආර්ථික ඇණවුම් ප්‍රමාණය | ඒකක | 1 000 |
| පොරොත්තු කාලය | සති | 3(අවම - 5(උපරිම) |

ප්‍රශ්න අංක 25

"A" අමුද්‍රව්‍යයෙහි උපරිම තොග මට්ටම කොපමණ ද ?

(1) ඒකක 1 750
(2) ඒකක 2 750
(3) ඒකක 3 500
(4) ඒකක 3 750
(5) ඒකක 4 000

ප්‍රශ්න අංක 26

"A" අමුද්‍රව්‍යයෙහි වාර්ෂික ඉල්ලුම කොපමණ ද?

(1) ඒකක 200 000
(2) ඒකක 400 000
(3) ඒකක 500 000
(4) ඒකක 1 250 000
(5) ඒකක 2 500 000

ප්‍රශ්න අංක 27 සහ 28 ට පිළිතුරු සැලයීම සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

යන්ත්‍ර සහ නිමැවුම් ලෙස නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් වන ගබඩාවකින් සමන්විත සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

| විස්තරය | යන්ත්‍ර | නිමවුම | ගබඩාව |
|---|---|---|---|
| අයවැය ගත පොදු කාර්ය පිරිවැය | රු. 175 000 | රු. 125 000 | රු. 50 000 |
| පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත | යන්ත්‍ර පැයකට රු. 20 | ශ්‍රම පැයකට රු. 10 | |

ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය , නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක අතරේ සමානව නැවත විභජනය කෙරේ. සමාගම නිපදවනු ලබන ,X, භාණ්ඩයේ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා යන්ත්‍ර පැය 02ක් සහ ශ්‍රම පැය 05 ක් ද අවශ්‍ය වේ.

**ප්‍රශ්න අංක 27**

යන්ත්‍ර සහ නිමැවුම් දෙපාර්තමේන්තුව භාවිත කිරීමට අපේක්ෂිත යන්ත්‍ර පැය සහ ශ්‍රම පැය පිළිවෙලින් කොපමණ ද ?

| | යන්ත්‍ර පැය | ශ්‍රම පැය |
|---|---|---|
| (1) | 8 750 | 12 500 |
| (2) | 10 000 | 15 000 |
| (3) | 10 000 | 10 000 |
| (4) | 17 500 | 6 250 |
| (5) | 20 000 | 7 500 |

**ප්‍රශ්න අංක 28**

"A" භාණ්ඩයේ ඇස්තමේන්තුගත ප්‍රාථමික පිරිවැය රු. 120 ක් නම්, එහි ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණද ?

(1) රු. 140
(2) රු. 150
(3) රු. 160
(4) රු. 170
(5) රු. 210

**ප්‍රශ්න අංක 29**

සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩයේ ඒකකයක නිෂ්පාදන පිරිවැය රු. 200 ක් වන අතර ඉන් 75% ක් විචල්‍ය වේ. සමාගම වර්තමානයේ දී ඒකක 14 000 ක් නිෂ්පාදනය කරන අතර, එහි දායක විකුණුම් අනුපාතය 50%කි. වර්තමාන ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දක්වා වැඩි වූ විට රු. 260 000 ක අතිරේක ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් දැරීමට සමාගමට සිදු වේ.
වර්තමාන ක්‍රියාකාරී මට්ටමේ දී සමච්ඡේද ලක්ෂ්‍යය (රුපියල් වලින්) සහ ක්‍රියාකාරී මට්ටම ඒකක 16 000 දී ඒකකයක නිෂ්පාදන පිරිවැය -

| | සමච්ඡේදන ලක්ෂ්‍යය (රු. '000) | ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 1 400 | 200.00 |
| (2) | 1 400 | 210.00 |
| (3) | 1 400 | 216.25 |
| (4) | 4 200 | 140.00 |
| (5) | 4 200 | 210.00 |

**ප්‍රශ්න අංක 30 සහ 31 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

අමර, තමර සහ චාමර ලාභලාභ සමසමව බෙදා ගන්නා ව්‍යාපාරයක හවුල්කරුවන් වේ. 2017.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්වල ශේෂයන් පහත පරිදි වේ.

රු.'000

| ගිණුම | අමර | තමර | චාමර |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 3 000 | 2 000 | 1 000 |
| ජංගම | 600 | 400 | 200 |

2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී හවුල් ව්‍යාපාරය රු. 2 700 000 ක ලාභයක් ඉපැයී ය. සෑම හවුල්කරුවෙකුම රු. 400 000 ක වාර්ෂික වේතනයකට සහ ඔවුන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් මත 10%ක පොලියකට හිමිකම් ලබයි. ප්‍රවර්තන වර්ෂය තුළ දී හවුල්කරුවන්ගේ ගැනිලි අමර රු. 60 000 , තමර රු. 40 000 සහ චාමර රු. 30 000.

2018.03.31 දින චාමර හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට ඔහුගේ කීර්ති නාම කොටස රු. 200 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. චාමර ගෙවිය යුතු මුදල ණය ගිණුමකට මාරු කරන ලදී.

**ප්‍රශ්න අංක 30**

2018.03.31 දිනට අමර සහ තමර ජංගම ගිණුම්වල ශේෂයන්,

| | අමර (රු.'000) | තමර (රු.'000) |
|---|---|---|
| (1) | 1 540 | 1 260 |
| (2) | 1 600 | 1 300 |
| (3) | 2 130 | 1 850 |
| (4) | 2 140 | 1 860 |
| (5) | 2 190 | 1 890 |

**ප්‍රශ්න අංක 31**

2018.03.31 දිනට අමරගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සහ චාමරගේ ණය ගිණුමේ ශේෂය,

| | ප්‍රාග්ධන ගිණුම - අමර (රු.'000) | ණය ගිණුම - චාමර (රු.'000) |
|---|---|---|
| (1) | 2 900 | 1 200 |
| (2) | 2 900 | 2 170 |
| (3) | 2 900 | 2 770 |
| (4) | 3 000 | 1 200 |
| (5) | 3 000 | 2 170 |

**ප්‍රශ්න අංක 32**

ලාභලාභ සමසමව බෙදා ගනිමින් පවත්වාගෙන යනු ලබන අමල් සහ කමල් ගේ හවුල් ව්‍යාපාරය හා පහත තොරතුරු බැඳේ.

ජංගම ගිණුමේ ශේෂයන්-

| | 2018.03.31 දිනට (රු.'000) | 2017.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| අමල් | 750 | 500 |
| කමල් | 450 | 300 |

හවුල් ව්‍යාපාර ගිවිසුමට .අනුව අමල් රු. 150 000 ක වාර්ෂික වැටුපකට හිමිකම් ලබයි. වර්ෂය තුළ දී අමල් සහ කමල් පිළිවෙලින් රු. 100 000 ක් සහ රු. 50 000 ක් මුදලින් ලබා ගන්නා ලදී.

පහත දෑ ගණනය කරන්න.

(අ) 2018.03.31 දිනෙන් අවනස් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය රු. ........................................

(ආ) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අමල් සහ කමල්ගේ ලාභ කොටස-

අමල් රු. .................. කමල් රු. .............................

**ප්‍රශ්න අංක 33**

සුදුසු තීරුවේ "✓" ලකුණක් යොදමින් නිෂ්පාදන සමාගමක පහත ගනුදෙනු තුලින් ඇති වන මුදල් ගලා ඒම් LKAS 7 (මුදල් ප්‍රවාහන ප්‍රකාශනය) ප්‍රමිතියට අනුව, මෙහෙයුම් , ආයෝජන සහ මුල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ග කරන්න.

| | | ක්‍රියාකාරකම් | |
|---|---|---|---|
| | මෙහෙයුම | ආයෝජන | මූල්‍ය |
| A - සාමාන්‍ය කොටස් නිකුවෙන් මුදල් ලැබීම | .................. | .................. | .................. |
| b - වෙළඳ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | .................. | .................. | .................. |
| C - මෝටර් රථයක් විකිණීමෙන් මුදල් ලැබීම | .................. | .................. | .................. |
| D - ස්ථාවර තැන්පතුවක් මත පොලිය ලැබීම | .................. | .................. | .................. |

ප්‍රශ්න අංක 34

LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි ) ප්‍රමිතියට අනුව සමාගමක පහත දැක්වෙන අවස්ථාවන් ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් නිරූපණය කරයි ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් (ඔව්/නැත) |
|---|---|
| A - ආරම්භක තොගය අධිගණනය වීම නිසා ලාභයෙහි ඇති වන වෙනස්වීම | ............................................ |
| B - වර්ෂය අවසානයේ ණයගැති ශේෂය මත අඩමාන ණය වෙන් කිරීමේ අනුපාතය වෙනස්වීම | ............................................ |
| C - තොග තක්සේරු ක්‍රමය පෙර - පිවිසි පෙර - පිට (FIFO) ක්‍රමයේ සිට භරිත සාමාන්‍ය ක්‍රමයට වෙනස්වීම | ............................................ |
| D - ගොඩනැගිලිවල අපේක්ෂිත ඵලදායි ජීව කාලය වසර 40 සිට 45 දක්වා වෙනස් වීම. | ............................................ |

ප්‍රශ්න අංක 35

නනි භාණ්ඩයක් නිෂ්පාදනය කතරන සමාගමකට පහත තොරතුරු අදාළ වේ.

| ඒකකයක විචල්‍ය පිරිවැය | | ස්ථාවර පිරිවැය | |
|---|---|---|---|
| විකුණුම් සහ පරිපාලන | රු. 20 | විකුණුම් සහ පරිපාලන | රු. 120 000 |
| නිෂ්පාදන | රු. 40 | නිෂ්පාදන | රු. 150 000 |

සමාගම ඒකක 5 000ක් නිෂ්පාදනය කර විකුණන ලද අතර, එම ක්‍රියාකාරකම් මට්ටමේ දී රු. 180 000 ක ලාභයක් උපයන ලදී.

පහත දෑ ගණනය කරන්න.

(අ) ඒකකයක දායකය රු ............................... (ආ) ඒකකයක විකුණුම් මිල රු . .........................

ප්‍රශ්න අංක 36

ඵලදායි ජීව කාලය වසර 05ක් සහ සුන්බුන් අගය රු. 300 000 ක් වූ නව යන්ත්‍රයක් රු. 1 000 000 කට මිලදී ගැනීමට සමාගමක් සැලසුම් කරමින් සිටී. මෙම යන්ත්‍රයෙන් සෑම වර්ෂයක දීම රු. 110 000 ක වාර්ෂික ලාභයක් ඉපැයීමට අපේක්ෂා කෙරේ. මෙම යන්ත්‍රයෙන් ජනනය වන මුදල් ප්‍රවාහයන් එහි ඵලදායි ජීව කාලය තුළ සමානව සිදු වේ යැ යි ද අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) 5 වන වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. ............................................

(ආ) පිළිගෙනුම් කාලය (වසර) ............................................

ප්‍රශ්න අංක 37

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08ට (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීම් සහ වැරදි ) අනුව ආයතනයකට එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ හැකි අවස්ථා දෙක සඳහන් කරන්න.

............................................................................................................

............................................................................................................

ප්‍රශ්න අංක 38

පහත එක් එක් අවස්ථාවේ සමාගමක ණය - හිමිකම් අනුපාතය වැඩි වේ ද , අඩු වේද , වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ණය - හිමිකම් අනුපාතය මත බලපෑම් |
|---|---|
| A - වත්කම් ඉහළ අගයකට ප්‍රත්‍යාගණනය කිරීම | ............................................ |
| B - දිගු කාලීන ණයක් ලබා ගැනීම | ............................................ |

C - ණයට භාණ්ඩ මිල දී ගැනීම ..............................

D - නව කොටස් නිකුතුවක් සිදු කිරීම ..............................

ප්‍රශ්න අංක 39 සහ 40 ට පිළිතුරු සැපයීමට පහත දී ඇති තොරතුරු භාවිතා කරන්න.

සමාගමක් විසින් විශේෂිත වර්ගයක ජංගම දුරකථනයක් නිෂ්පාදනය කර ඒකකයක් රු. 25 000 ක මිලකට විකුණනු ලබයි. සමාගමේ ඉදිරි වර්ෂය සඳහා අයවැයගත විකුණුම් , ඒකක 400 ක් වන අතර එය එහි ධාරිතාවයෙන් 80% කට සමාන වේ. මෙම මෙහෙයුම් මට්ටමේ දී අයවැයගත පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | රු. 4 000 000 |
| සෘජු ශ්‍රමය | රු. 2 000 000 (නිපදවන ඒකක ප්‍රමාණය මත ගෙවනු ලැබේ) |
| මුළු පොදු කාර්ය පිරිවැය | ස්ථාවර රු. 75 000, විචල්‍ය රු. 1 000 000 |

ප්‍රශ්න අංක 39

පහත දෑ ගණනය කරන්න.

(අ) සමච්ඡේද ලක්ෂ්‍යය (ඒකක) - ..............................

(ආ) ආරක්ෂිත ආන්තිකය (රුපියල්) - ..............................

ප්‍රශ්න අංක 40

විකුණුම් මිල 10% කින් අඩු වීම නිසා, විකුණුම් ඒකක ගණන සමාගමේ ධාරිතාවයෙන් 90% ක් දක්වා වැඩි වුයේ නම් , ලාභයේ වැඩි වීම හෝ අඩු වීම කොපමණද ?

..............................

ප්‍රශ්න අංක 41

අනිකුත් සාධක වෙනස් නොවන්නේ නම් පහත එක් එක් අවස්ථා නිසා ආයෝජන ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය වැඩි වේද , අඩු වේද , වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

| අවස්ථාව | ශුද්ධ වර්තමාන අගය මත බලපෑම |
|---|---|
| A - ආරම්භක ආයෝජනයේ වැඩි වීමක් | .................... |
| B - වාර්ෂික ක්ෂයවීම් වල වැඩි වීමක් | .................... |
| C - අපේක්ෂිත වාර්ෂික මුදල් ගලා යෑම්වල අඩු වීමක් | .................... |
| D - වට්ටම් අනුපාතයේ අඩු වීමක් | .................... |

ප්‍රශ්න අංක 42

2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ දී සමාගමක් කොටසක් රු. 30 බැගින් සාමාන්‍ය කොටස් 250 000 ක් නිකුත් කරන ලදී. මුළු මුදල ද සමඟ කොටස් 300 000 ක් සඳහා අයදුම්පත් ලැබුණි. සමාගම කොටස් 250 000 සමානුපාතිකව විභජනය කරන ලද අතර අතිරික්ත මුදල් අයදුම්කරුවන් වෙත නැවත යවන ලදී. පහත දෑ සඳහා ජර්නල් සටහන් ලියා දක්වන්න.(සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ)

(අ) අයදුම්පත් සමඟ මුදල් ලැබීම

..............................

..............................

(ආ) කොටස් විභජනය කිරීම

..............................

..............................

ප්‍රශ්න අංක 43

අදාළ තීරුවෙහි "✓" ලකුණක් යොදමින් වෙළඳ සමාගමක පහත ගනුදෙනු තුළින් ඇති වන මුදල් ගලා යාම් මෙහෙයුම් , ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වර්ග කරන්න.

| | ක්‍රියාකාරකම් | | |
|---|---|---|---|
| | මෙහෙයුම | ආයෝජන | මූල්‍ය |
| A - භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවිය යුතු මුදල් පියවීම | .................. | .................. | .................. |
| B - කල්බදු ණයහිමියෙකුට වාර්ෂික කල්බදු වාරිකය ගෙවීම | .................. | .................. | .................. |
| C - සාමාන්‍ය කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීම | .................. | .................. | .................. |
| D - මෝටර් රථයක් මුදලට මිල දී ගැනීම | .................. | .................. | .................. |

ප්‍රශ්න අංක 44

සුදුසු තීරුවෙහි "✓" ලකුණක් යොදමින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුව පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව සඳහන් කරන්න.

| ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|
| A - ප්‍රතිපාදනයක් යනු නිශ්චිත කාලයක් හෝ ප්‍රමාණයක් නොමැති වගකීමකි | ................. | ................. |
| B - අසම්භාව්‍ය වගකීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගනී | ................. | ................. |
| C - ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ප්‍රවර්තන සහ අනාගත ගිණුම් කාලච්ඡේදවල ගලපයි | ................. | ................. |
| D - ආයතනයක ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කිරීම සෑම විටම කළමනාකරුවන්ගේ අභිමතය පරිදි සිදු වේ. | ................. | ................. |

ප්‍රශ්න අංක 45

පහත එක් එක් ගනුදෙනුව සමාගමක ක්ෂණික අනුපාතය මත කරනු ලබන බලපෑම වැඩි වේ ද, අඩු වේද, වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

| ගනුදෙනුව | බලපෑම |
|---|---|
| A - ණයගැතියන්ගෙන් මුදල් ලැබීම | .................................................. |
| B - ණය පදනම මත මිල දී ගත් භාණ්ඩ ආපසු යැවීම | .................................................. |
| C - ඉදිරි වර්ෂය සඳහා රක්ෂණ වාරික ගෙවීම | .................................................. |
| D - මෝටර් රථයක් විකිණීමෙන් මුදල් ලැබීම | .................................................. |

ප්‍රශ්න අංක 46

2018.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක විකුණුම් රු. 9 000 000 ක් වූ අතර, එයින් 80% ක් ණයට විකුණුම් ය. සමාගමේ විකුණුම් මත දළ ලාභ ආන්තිකය 30% කි. පහත තොරතුරු ද දී තිබේ.

| | 2018.03.31 දිනට (රු.) | 2017.03.31 දිනට (රු.) |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 1 000 000 | 800 000 |
| තොගය | 500 000 | 900 000 |

වර්ෂය තුළ වැඩ කරන දින ගණන 360 ක් ලෙස උපකල්පනය කරමින් 2018.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

(අ) ණයගැති පිරිවැටුම් අනුපාතය ..................................................

(ආ) තොග රැඳවුම් කාලය ..................................................

**ප්‍රශ්න අංක 47**

නිෂ්පාදන සමාගමක පිරිවැය දත්ත පහත දී ඇත.

| | |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | ඒකකයකට රු. 15 |
| සෘජු ශ්‍රමය | ඒකකයකට රු. 25 |
| විචල්‍ය පොදු කාර්ය පිරිවැය - | |
| නිෂ්පාදන | ඒකකයකට රු. 10 |
| නිෂ්පාදන නොවන | ඒකකයකට රු. 15 |
| ස්ථාවර පොදු කාර්ය පිරිවැය - | |
| නිෂ්පාදන | රු. 50 000 |
| නිෂ්පාදන නොවන | රු. 30 000 |

ඉලක්ක නිෂ්පාදනය ඒකක 1 000 ක දී පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. ......................

(ආ) මුළු පොදු කාර්ය පිරිවැය රු. ......................

(ඇ) මුළු විචල්‍ය පිරිවැය රු. ......................

**ප්‍රශ්න අංක 48**

සමාගමක් නිෂ්පාදනය කරන "X" නැමැති භාණ්ඩයට පහත තොරතුරු අදාළ වේ.

| | |
|---|---|
| ඒකකයක විචල්‍ය පිරිවැය | රු. 90 |
| ස්ථාවර පිරිවැය | රු. 60 000 |
| දායක විකුණුම් අනුපාතය | 40% |

පහත දෑ ගණනය කරන්න.

(අ) සමච්ඡේදන ලක්ෂය රු. ......................

(ආ) ඒකක 1 200 මට්ටමේ දී අපේක්ෂිත ලාභය රු. ......................

**ප්‍රශ්න අංක 49**

සීමිත තුරුලිය පොදු සමාගම නව යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රය මිල දී ගතහොත් , දැනට භාවිතයේ පවතින යන්ත්‍රය රු. 200 000 කට විකිණිය හැකිය. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය වසර 04ක් වන අතර, ඊට අදාළ අනිකුත් තොරතුරු පහත දැක්වේ.

| | රු.'000 |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | 600 |
| ස්ථාපිත කිරීමේ පිරිවැය | 50 |
| 4 වන වසර අග සුන්බුන් අගය | 120 |
| ආරම්භයේදී අවශ්‍ය වන කාරක ප්‍රාග්ධනය | 100 |
| අපේක්ෂිත වාර්ෂික මුදල් ගලා ඒම් | 240 |

පහත දෑ ගණනය කරන්න.

(අ) ආරම්භක ආයෝජනය රු. ......................

(ආ) 4 වන වර්ෂය සඳහා මුළු මුදල් ගලා ඒම් රු. ......................

**ප්‍රශ්න අංක 50**

පහත සඳහන් තොරතුරු නිෂ්පාදිතයකට අදාළ වේ.

| | |
|---|---|
| ඒකක 50 ක් විකුණන විට මුළු පිරිවැය | රු.65 000 |
| ඒකක 75 ක් විකුණන විට මුළු පිරිවැය | රු. 90 000 |
| විකුණුම් මත දායක අනුපාතය | 50% |

රු. 125 000 ක ලාභයක් ලැබීමට අලෙවි කළ යුතු ඒකක ප්‍රමාණය ගණනය කරන්න.

......................................................................

සකස් කලේ - බන්දුල විතානගේ
- රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල